සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

15 | S | I

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 11 - 2019

**නම/විභාග අංකය : ............................................ ක්‍රිස්තියානි ධර්මය - I** කාලය : පැය 01යි.

වැදගත් :

- ❊ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට එක් ලකුණ බැගින් ලකුණු 40ක් හිමිවේ.
- ❊ අංක 1 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ❊ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

(01) මුල් මිනිස් යුවල දේව සබඳතාව පලුදු කර ගත්තේ,
(1) තෘෂ්ණාව නිසා ය. (2) ආත්මාර්ථකාමය නිසා ය.
(3) අහංකාරය නිසා ය. (4) අකීකරුකම නිසා ය.

(02) මරියතුමිය තමකම නසා දේව අණට කීකරු වූ බව පැහැදිලි වන කියමන වන්නේ,
(1) උපදින පාරිශුද්ධ දරුවා දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝයයි කියනු ලබන්නෝ ය.
(2) දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැත යන්නයි.
(3) මම සමිඳාණන් වහන්සේගේ දාසිය වෙමි ඔබ පැවසූ ලෙසට මට ඉටුවේවා යන්නයි.
(4) මාගේ ආත්මය මා මිදුම්කාර දෙවිදුන් ගැන උදම් අනයි යන්නයි.

(03) එම්බා බෙත්ලෙහෙම එප්‍රාතා ති ජුදාහි ගෝත්‍රවලින් ඉතා අල්ප වන්නේ ය. මෙසේ ප්‍රකාශ කරන දිවැසිවරයා වන්නේ,
(1) යෙසායා (2) මීකා
(3) මලාකි (4) එසකියෙල්

(04) ''ඔටුලොම් වස්ත්‍රයක් ඇඳ ඉනවටා හම් පිටියක් බැඳ සිටියේ ය.''
ඉහත සඳහන් වන්නේ ................ උපත පිළිබඳ පසුබිම වේ.
(1) ඊසාක් ගේ (2) ආබ්‍රහම් ගේ
(3) ස්නාවක ජෙනාන්ගේ (4) ජේසුතුමන් ගේ

(05)




ඉහත පුද්ගල චරිත අතරින් දේව හඬ මගින් කතා නොකළ චරිතයක් වන්නේ,
(1) සෙකරියස් තුමා (2) එළිසබෙත් තුමිය
(3) ජොසප් තුමා (4) මරියතුමිය

(06) දිවැස් වැකියට අනුව උපදින දරුවාට තබන ලද එම්මානුවෙල් යන නාමයේ අර්ථය වන්නේ,
(1) ආලේප ලත් තැනැත්තා යන්න ය.
(2) දෙවියන් වහන්සේ අප සමගය යන්න ය.
(3) දෙවියන් වහන්සේ විසින් ඔසවනු ලැබූ යන්න ය.
(4) දෙවිදුන්ගෙන් ඉල්ලාගත් යන්න ය.

(07) එඬේර සංකල්පය වඩාත් අර්ථවත් ලෙස ඉදිරිපත් කරන බයිබල් පුස්තකය වන්නේ,
(1) මීකා සහ යෙසායා ය. (2) එසකියෙල් හා ගීතාවලීය ය.
(3) යෙසායා හා ගීතාවලිය ය. (4) ගීතාවලිය හා මීකා ය.

(08) මන්ද ඔහු ස්වාමීන් වහන්සේ අභිමුවෙහි ශ්‍රේෂ්ඨ වන්නේ ය.
මෙම ප්‍රකාශය කරන්නේ කවුරුන් සම්බන්ධව ද?
(1) එම්මානුවෙල් (2) සීමියොන් (3) ජොහාන් (4) පේදුරු

(09) ජුදෙව්වරුන් හා මුල් කිතුණුවන් සාමය පැතීම සඳහා භාවිතා කළ හෙබ්‍රෙව් වචනය වන්නේ,
(1) අයිරේනියා (2) සෙත්වේවා (3) ශාලෝම් (4) අගාපේ

(10) A - ජෝසප් තුමා B - මරියතුමිය
C - එලිසබෙත්තුමිය D - සෙකරියස් තුමා
මේ අය අතරින් දේව කැමැත්තට කීකරුව එය ඉටු කිරීමට ත්‍යාගීව ප්‍රසංසා ගීත ගායනා කරනු ලැබුවේ,
(1) A හා B ය. (2) B හා C ය. (3) A හා D ය. (4) B හා D ය.

(11) ජුදෙව් සමාජය විසින් සුළු කොට ගණන් ගනු ලැබූ පිරිසකි.
(1) එඬේරුන් (2) රෝගීන් (3) පව්කරුවන් (4) අන්‍යජාතීන්

(12) මිසරයේ වහල්කමින් මිදී පිට වූ රාත්‍රියේ දී ඉශ්‍රායෙල් කුළුදුල් පිරිමි දරුවන් විනාශ නොවී ආරක්ෂා වීම සිහිපත් කරමින් ජුදෙව්වන් විසින් ඉටු කරනු ලැබූ චාරිත්‍රය වන්නේ,
(1) චර්මඡේදනය කිරීම. (2) දේව මාළිගයට යෑම.
(3) බෞතීස්ම කිරීම. (4) ඉපදී දින 40කට පසු කැප කිරීම.

(13) සෙබදිගේ පුත්‍රයෙක් හා ජාකොබ්ගේ සොහොයුරෙකි. තවද සර්ජනාවේ පුත්‍රයෝ ලෙස හඳුන්වන ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෙකි.
(1) සීමොන් (2) ජාකොබ් (3) ජොහාන් (4) අන්ද්‍රෑ

(14) ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් සැත්තෑ දෙනා හා දොළොස් දෙනා පිටපත් කර යැවීමෙන් අපට පසක් කර දෙන්නේ,
(1) චාම් ලෙස ඇඳ පැළඳිය යුතු බව
(2) වගවලසුන් වෙත යාමට සූදානම් විය යුතු බව
(3) සියලු ආකාර යක්ෂයන්ට වඩා බලවත් විය යුතු බව
(4) සුබ අස්න ප්‍රමාද නොවී ප්‍රකාශ කළ යුතු බව

(15) දේව මාළිගා බද්ධ ගෙවීම සඳහා ජුදෙව්වන් භාවිතා කළේ,
(1) දිනාර් කාසිය. (2) රෝම කාසි ය.
(3) රිදී කාසිය. (4) තඹ කාසි ය.

(16) ඔබ අයකැමියන් සමඟ කන්නෙත් බොන්නෙත් මන්ද? මෙසේ ජේසුස් වහන්සේගෙන් ප්‍රශ්න කළේ,
(1) පරිසිවරුන් හා විනයධරයන් (2) සද්දුසිවරුන් හා විනයධරයන්
(3) නායක පූජකයන් හා පරිසිවරු (4) සද්දුසිවරු හා පූජකයන්

(17) අසීසියේ ෆැන්සිස් තුමන්ගේ යැදුම වූයේ,
(1) ස්වාමීනි මා මිදුව මැනව යන්නයි.
(2) ස්වාමීනි ඔවුන්ගේ වරදට කමා වුව මැනව යන්නයි.
(3) ස්වාමිනී මා ඔබගේ උපකරණයක් කර ගත මැනව යන්නයි.
(4) ස්වාමීනි මා කෙරෙන් ඉවත් වුව මැනව යන්නයි.

(18) කිතුණුවන් දේව සේවයෙහි යෙදිය යුත්තේ,
(1) නපුරු බලවේග තමන්ට අවනත වන බව දැක ප්‍රීති වීමෙනි.
(2) ස්වර්ගයේ නම ලිය වී තිබෙන නිසා ප්‍රීති වීමෙනි.
(3) තමන් අතින් රෝග සුව වන නිසා ප්‍රීති වීමෙනි.
(4) බොහෝ දෙනෙක් තම වචනය අසන නිසා ප්‍රීති වීමෙනි.

(19) ජේසුස් වහන්සේ රාජ්‍ය තේජසින් ජෙරුසලමට යෑම සඳහා කොටළුවකු තෝරා ගැනීමෙන් ගම්‍ය වන්නේ,
(1) කොටළුවෙකු පිට යෑමෙන් ගෞරවයක් ලැබෙන බව ය.
(2) ජේසුස් වහන්සේ අශ්වයෙකු පිට යෑමට අකමැති වූ බව ය.
(3) කොටළුවා සාමයේ හා අහිංසකත්වයේ සංකේතයක් ලෙස යොදා ගත් බව ය.
(4) ජේසුස් වහන්සේ නිරන්තරයෙන් වෙනස් දෙයක් කිරීමට උත්සාහ කරන බව ය.

(20) දේව සේවයට කැප වූ සේවය තුළ සුහදශීලී වාතාවරණයක් ගොඩනැගූ ලාංකීක සේවක නායකයෙකු වූයේ,

(1) පීටර් ජෙරාඩ් ද සිල්වා දේවගැති තුමා ය. (2) ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා ය.

(3) තිස්ස බාලසූරිය පියතුමා ය. (4) ගරු මයිකල් රුද්‍රිගු පියතුමන් ය.

(21) ජේසුස් වහන්සේගේ නාසරිය ප්‍රකාශනයට අනුව දේව රාජ්‍ය ප්‍රකාශ කිරීමේ ඉලක්ක කණ්ඩායමක් ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.

(1) අන්ධයින්, පීඩිතයන් හා වහලුන් (2) දිළින්දන්, පීඩිතයන් හා වහලුන්

(3) දිළින්දන්, අන්ධයන් හා පීඩිතවුවන් (4) දිළින්දන් අයකැමියන් හා වහලුන්

(22) කුඩා දරුවන් වරදට පැමිණවීමේ බරපතලකම ගැන ඉගැන්වීමේදී ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ එසේ කරන අය,

(1) අල්ලා දඬු කඳෙහි ගැසිය යුතු බවයි.

(2) ඉන් වළක්වා ගන්නට ක්‍රියා කළ යුතු බවයි.

(3) ගෙලවටා ඇඹරුම් ගලක් එල්ලා මුහුදට හෙළිය යුතු බවය.

(4) දරුණු වන සතුනට කන්න දැමිය යුතු බවයි.

(23) ජුදෙව්වන් අතරින් නායක පූජකයන් හා වැඩිමහල්ලන් තේරීපත් වූයේ,

(1) සද්දුසිවරුන් අතුරිනි. (2) විනයධරයන් අතුරිනි.

(3) පරිසිවරුන් අතුරිනි. (4) ලියන්නන් අතුරිනි.

(24) හාරාන් දේශයෙන් ආබ්‍රහම් ඇතුළු පවුලේ සමාජිකයන්ව කැඳවනු ලැබේ,

(1) සිය පියා විසින් ය. (2) දෙවියන් වහන්සේ විසින් ය.

(3) හෙරොද් රජු විසින් ය. (4) පාරාවෝ රජු විසින් ය.

(25) බාහිර වත්පිළිවෙත් ගැන උවමනාවටත් වඩා සැලකිලිමත් වුවත් ආත්මීක පවිත්‍රතාවය රැකගැනීමට උදාසීන වූ ආගමික කණ්ඩායම වන්නේ,

(1) විනයධරයන් ය. (2) සෙලට්වරුන් ය.

(3) පරිසිවරුන්ය. (4) එසෙනිවරුන් ය.

(26) ඉශ්‍රායෙල් ජන සමාජය තුළ විනය ගරුක සමාජයක් ගොඩනැගී ඇත්තේ දෙවියන් වහන්සේ විසින් ............ ලබාදීම මුල් කර ගෙනය.

(1) ලෝකය මැවීම. (2) ආබ්‍රහම් කැඳවීම.

(3) මෝසෙස් කැඳවීම. (4) දස පනත.

(27) A - දෙවි සමිඳාණන්ගේ නාමය අගරු ලෙස භාවිතා නොකරව

B - පියාට ද මෙවට ද ගෞරව කරව

C - සොරකම් නොකරව

D - සබත් දවස ශුද්ධ ලෙස ගත කරන්නට සිතට ගන්න.

ඉහත පනත්වලින් දෙවියන් වහන්සේ හා මිනිසා අතර සම්බන්ධතාවය දක්වන පනත් වන්නේ,

(1) A හා C ය. (2) B හා C ය. (3) A හා D ය. (4) C හා D ය.

(28) මෙසියස් වහන්සේගේ රාජ්‍යයේ සාමයට කෙළවරක් නොවන බව පෙන්වා දුන් දිවැසිවරයා වන්නේ,

(1) මීකා ය. (2) යෙසායා ය. (3) මලාකී ය. (4) ආමොස් ය.

(29) පහත පුද්ගලයන් අතරින් එඬේර වෘත්තියේ නියුතු වූ අයෙක් නොවන්නේ,

(1) දාවිත් ය. (2) ආබෙල් ය. (3) ආබ්‍රහම් ය. (4) සාවුල් ය.

(30) ''සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය.''............

A - ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය.

B - ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යැයි කියනු ලබන්නෝ ය.

C - ඔවුහු දේශය උරුමකර ගන්නෝ ය.

D - ඔවුහු සැනසීම ලබන්නෝ ය.

ඉහත වාක්‍යයේ හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

(31) කිතුණු අපගේ යාච්ඤා ජීවිතයේ ප්‍රධාන අරමුණු විය යුත්තේ,

(1) ශුද්ධවන්තයින් ලෙස පෙනී සිටීම ය.

(2) අපේ පව් ගැන පසුතැවිලි වීම ය.

(3) දෙවියන් වහන්සේ සමග ගැඹුරු සම්බන්ධතාවයකට ඇතුළුවීම ය.

(4) අවශ්‍යතාවයන් දෙවියන්ගෙන් ඉල්ලා සිටීම ය.

(32) ශුද්ධ බයිබලයේ ප්‍රේම පාරමිතාව සඳහන්ව ඇත්තේ...... ග්‍රන්ථය තුළ ය.

(1) ගලාති (2) තෙසලෝනික (3) රෝම (4) I කොරෙන්ති

(33) මිනිසා සියලු අන්දමේ වහල් බැඳීම්වලින් හා පීඩාවලින් නිදහස ලබන්නේ,

(1) මෙසියස් වහන්සේගේ උපත තුළිනි.

(2) මෙසියස් වහන්සේගේ ජීවිත පූජාව තුළිනි.

(3) මෙසියය් වහන්සේගේ කැප වූ ජීවිතය තුළිනි.

(4) මෙසියස් වහන්සේගේ ආදරය තුළිනි.

(34) පවාදීමෙන් පසු ජේසුස් වහන්සේ අල්ලාගත් මුර සෙබලුන් උන් වහන්සේ රැගෙන ගියේ,

(1) උත්තම පූජකයා ළඟට ය. (2) රෝම අධිරාජයයා ළඟට ය.

(3) පිලාත් ආණ්ඩුකාරයා ළඟට ය. (4) හෙරොද් රජු ළඟට ය.

(35) දුක් විඳින සේවකයා සතු ලක්ෂණයක් නොවන්නේ,

(1) දුක වේදනාව දරා ගැනීම (2) පව්කරුවන්ගේ පව් දරා ගනිමින් මැදිහත්කාරකම් කිරීම.

(3) මෘදු ලීලාවකින් සැරසි සිටීම (4) දුකට හා පීඩාවට පත් වූවන් තවත් පීඩාවට ලක් කිරීම.

(36) ජේසුන් වහන්සේ පරීක්ෂා හා සටන් කිරීමෙන් අපට උගන්වන්නේ

(1) දේව කැමැත්තට අනුකූලව සුමඟ සෙවීමට ය.

(2) උපවාසයේ සිට යාච්ඤා කිරීමට ය.

(3) යහපත් ලෙස පෙනෙන දෙයින් සෑහීමට පත් වීම ය.

(4) වඩා පහසු මඟ ඔස්සේ ගමන් කිරීමට ය.

(37) අන්වෙසක් වීමේ දී ජේසුන් වහන්සේට දෙපසින් දර්ශනය වූයේ,

(1) එළියා හා පේදුරු ය. (2) පේදුරු හා ජාකොබ් ය.

(3) මෝසෙස් හා එළියා ය. (4) මෝසෙස් හා ජාකොබ් ය.

(38) කිතුණු ගෝලකමට කැඳවන ලද ඔබ ප්‍රේරිතකම තේරුම් ගත යුත්තේ,

(1) පූර්ණ කාලීනව සේවයට කැපවීමෙනි.

(2) අර්ධ කාලීනව සේවයට කැපවීමෙනි.

(3) විශේෂ මෙහෙවරක් සඳහා පුහුණු කර යවනු ලැබූවෙක් වීමෙනි.

(4) දිනපතා කුරුසිය රැගෙන යන්නට උපදෙස් දෙන්නෙක් වීමෙනි.

(39) A - පරිසිවරුන්, B - රජවරුන්, C - දිවැසිවරුන්, D - විනයධරයින්

මෙම ජන කණ්ඩායම් අතුරින් ඉශ්‍රායෙල් ඉතිහාසයේ ආලේපය ලැබූ ජන කණ්ඩායම් වන්නේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය. (4) A හා D ය.

(40) මෙලොව ස්ථිර සාමයක් ඇති වීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය වන්නේ.

(1) යුක්තිය හා සාධාරණත්වය (2) ඉවසීම හා දයාව

(3) යුක්තිය හා ඉවසීම. (4) දයාව හා සාධාරණත්වය

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

| 15 | S | II |
|---|---|---|

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

## First Term Test - Grade 11 - 2019

නම/විභාග අංකය : ............................................. ක්‍රිස්තියානි ධර්මය - II කාලය : පැය 02යි.

වැදගත් :

✳ පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (i) දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දු දෙකක් ලියන්න.

(ii) දේව ප්‍රේමයෙන් ඈත්වීම නිසා මිනිසා දූෂිත තත්ත්වයට පත්වීමට මූලික වූ කරුණු දෙකක් ලියන්න.

(iii) සාමය උදෙසා කැපවීමෙන් ක්‍රියා කළ පූජකවරුන් දෙදෙනකු නම් කරන්න.

(iv) ජුදෙව් සමාජයේ පිරිමි දරුවන් අවුරුදු 12 දී වැඩිහිටියන් ලෙස පිළිගනු ලැබුවේ ය. එහි දී ඔවුන්ට හිමි වූ ජුදා චාරිත්‍ර දෙකක් පෙන්වා දෙන්න.

(v) සමාජයේ සාධාරණයක් ඇති කිරීම සඳහා සාමාන්‍ය ජනතාව වෙත ස්නාවක ජොහාන් ඉදිරිපත් කළ අභියෝග දෙක කුමක් දැයි පෙන්වා දෙන්න.

(vi) ''මාගේ මෑණියොත් සහෝදරයෝත් නම් දෙවියන් වහන්සේගේ වචනය අසා ඒවා පිළිපදින්නෝ වෙති.'' මින් අදහස් කරන්නේ කුමක් දැයි පෙන්වා දෙන්න.

(vii) ''යළිත් ඔබ හැරුණු පසු ඔබේ සහෝදරයින් ධෛර්යමත් කරන්න.'' මෙසේ පැවසූයේ කවුරුන් විසින් කා හට ද?

(viii) අරමාතියේ ජෝසෙප් තුළ ඔබ දකින ගුණාංග දෙකක් ලියන්න.

(ix) ජේසුස් වහන්සේට පැමිණි පළමු පරීක්ෂාව හා දුන් පිළිතුර ලියා දක්වන්න.

(x) දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති පෙන්වීම සඳහා ජේසුස් වහන්සේ වදාළ උපමා කථා දෙකක් ලියන්න.

(ලකුණු 2 x 10 =20)

(02) (i) පේදුරුතුමාගේ මහා ප්‍රකාශය ලියා දක්වන්න. (ලකුණු 2)

(ii) අන් වෙසක් වන අවස්ථාවේදී ජේසුස් වහන්සේ සමඟ කථා කළ අය කවරහු ද? ඔවුන් මගින් සංකේතවත් කළේ කුමක් ද? (ලකුණු 3)

(iii) අන් වෙසක් වීමේ සිද්ධියෙන් ජේසුන් වහන්සේ ශ්‍රාවකයන්ට අනාවරණය කළේ කුමක් දැයි පහදන්න. (ලකුණු 5)

(03) (i) ''මිත්‍රය ඔබේ පව් ඔබට කමා කරන ලදී.'' මෙලෙස ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ කාටද කුමන අවස්ථාවකදී ද ලියා දක්වන්න. (ලකුණු 2)

(ii) සබත් දවස ශුද්ධ කොට පැවැත්වීම පිළිබඳ ජේසුස් වහන්සේ අවධාරණය කළ කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

(iii) කිතුණු දිවියේ යහ පැවැත්ම උදෙසා ජේසුස් වහන්සේ හා පරිසීන් විනයධරයන් අතර පැවැති සංවාද තුළින් අපගේ ජීවිතවලට එකතු කර ගත හැකි ගුණාංග පහක් ලියා දක්වන්න. (ලකුණු 5)

(04) (i) ''මෙසියස්'' යන වචනයේ අර්ථය පහදන්න. (ලකුණු 2)

(ii) රජකම හා මෙසියානු සංකල්පයේ විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 3)

(iii) වර්තමාන සමාජයේ සාම රාජ්‍යයක් උදා කිරීමට ඔබ කරන යෝජනා 5ක් පහදන්න. (ලකුණු 5)

(05) (i) ජේසුස් වහන්සේගේ ප්‍රේමය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ ප්‍රධාන කොටස් දෙක කුමක් ද? (ලකුණු 2)

(ii) ජේසුස් වහන්සේ ජීවිතයේ ප්‍රේමය අර්ථ ගැන් වූයේ කෙසේ දැයි කරුණු තුනකින් පෙන්වා දෙන්න. (ලකුණු 3)

(iii) ඔබ සමාජය තුළ කිතුණු ප්‍රේමය ප්‍රායෝගිකව අර්ථ ගන්වන්නේ කෙසේ දැයි කරුණු පහකින් පහදන්න. (ලකුණු 5)

(06) (i) මනස්ථාපනයේ බෞතිස්මය ලබාදීමට ක්‍රියා කළේ කවුරුන් ද? (ලකුණු 2)

(ii) මනස්ථාපනයේ බෞතිස්මය තුළින් දේව රාජ්‍යයේ පුරවැසියන්ට හිමි වන වටිනාකම් තුනක් වන්නේ මොනවා දැයි පෙන්වා දෙන්න. (ලකුණු 3)

(iii) ජේසුස් වහන්සේගේ නැවත පැමිණීමේ මොහොත බලාපොරොත්තුවෙන් ජීවත් වන ඔබ ජීවත් විය යුතු ආකාරය පහදන්න. (ලකුණු 5)

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) පාස්කු මංගල්‍යයන්

(ii) දේව රාජ්‍යයේ වර්ධනය

(iii) යහපත් බැටළු එඬේරාණෝ

(iv) ආබ්‍රහම්ගේ ඇදහිල්ල (ලකුණු 2 x 5= 10)